# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2316/42 - 2023 ජනවාරි මස 26 වැනි බ්‍රහස්පතින්දා - **2023.01.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : කැ.ප්‍රා.ලේ./අත් 8/9/1.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/8/2015/PC/250.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කර ඇති බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 535, පැපිළියාන බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පැපිළියාන බටහිර (බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික් ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 521213 කළාප අංක 04 පත්‍ර අංක 02 හා 2022.10.05 දිනැති පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0336 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස (01);

**01. කැබලි අංක 01**

ඉඩමේ නම : කජුගහවත්ත; ඉඩමේ විස්තරය : ක්‍රීඩා භූමිය; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා : අංක 20, විජේරාම මාවත, කොළඹ ලිපිනයේ පදිංචි ශ්‍රියාංගනී ගුණතිලක (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය : හෙක්ටයාර් 0.0336

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 මාර්තු මස 22 වැනි දින පෙ.ව. 10.00ට කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2023 මාර්තු මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**කේ. පී. ජේමදාස,**
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කැස්බෑව.

2023 ජනවාරි මස 23 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01-0255




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : THI/LND/L2/ACQVI/146
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/6/2018/HW/451.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කර ඇති බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ/පරවශතාවේ විස්තර :*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 335ඒ, කපුදූව ග්‍රාම නිලධාරි වසමට අයත් කපුදූව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද 2022.11.28 දිනැති හා අවසාන ගම් පිඹුරු අංක මු.පි.මාර 2916 හි කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0427 ක් වූ පහත සඳහන් ඉඩම;

01. කැබලි අංක 01
ඉඩමේ නම : පාළුවත්ත හයෙන් පස්පංගු කැබැල්ල; ඉඩමේ විස්තරය : ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් සහ ළිඳක් ඇත; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0427

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 පෙබරවාරි මස 20 වැනි දින පෙ.ව. 10.00ට තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2023 පෙබරවාරි මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී *ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**ඩී. එච්. යූ. සඳමාලි,**
ප්‍රාදේශීය ලේකම්/ඉඩම්
අත්කර ගැනීමේ නිලධාරි,
තිහගොඩ.

2023 ජනවාරි මස 13 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01-0256

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.